# ළමා අපයෝජන /ළමා සැකකරුවන් පිළිබඳ වාර්තාකරණයේදී ළමා අයිතිවාසිකම් සුරකීම සඳහා ජනමාධ්‍යවේදීන් විසින් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳජාතික මාර්ගෝපදේශසංග්‍රහය

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජාතික විද්වත් මණ්ඩලයක මාර්ගෝපදේශකත්වයෙන්, ජනාධිපති කාර්යාලයේ දරුවන් සුරකිමු වැඩසටහනට සමගාමීව මෙම ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය සකසා ඇත.**

## <u>පූර්විකාව</u>

ශ්‍රී ලංකාවේ සියලුම ජනමාධ්‍ය ආයතන හා ජනමාධ්‍යවේදීන් සඳහා බලපානු ලබන මෙම ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය මෙරට සිදුවන ළමා අපයෝජන /ළමා සැකකරුවන් පිළිබඳ වාර්තාකරණයේදී ළමා අයිතිවාසිකම් සුරකීම සඳහා ජනමාධ්‍යවේදීන් විසින් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳව මඟපෙන්වීම අරමුණු කොට ගත්තකි.

දැයේ දරුවන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරමින් ඔවුන්ට සුරක්ෂිත සමාජ වටපිටාවක් උරුම කර දීම සියලු පාර්ශවයන්ගේ යුතුකම මෙන්ම වගකීම ද වේ. විශේෂයෙන් වැඩිහිටියන්ට හිමි වන සියලු අයිතිවාසිකම් ළමුන්ට ද හිමිවේ. ඊට අමතරව,හිංසනයෙන් ආරක්ෂා වීමේ අයිතිය ද ඔවුන් සතුය.

ළමයින් පිළිබඳ වාර්තා කිරීමේදී ඊට සීමාවක් පැවතිය යුතුය. ඇතැම් අවස්ථාවලදී අපයෝජනයට පත් ළමයින් පිළිබඳ මෙන්ම සැකකරුවන් බවට පත්වන ළමයින් පිළිබඳ තොරතුරු ජනමාධ්‍ය ඔස්සේ වාර්තා කිරීමෙන් ඔවුන් සමාජය ඉදිරියේ මානසිකව දැඩි අපහසුතාවට ලක්වේ. එය ඔහුගේ/ ඇයගේ සමස්ත ජීවිතයටම බලපානු ලබයි. එවැනි අවස්ථාවලදී එම ළමයින් පිළිබඳ වාර්තා කිරීම සහ ඔවුන්ගේ සම්මුඛ සාකච්ඡා ලබාගැනීම ප්‍රවේසමෙන් කළ යුතුය. ළමයා පිළිබඳ වාර්තා කරන ඕනෑම අවස්ථාවකදී ඔහුට/ඇයට හානි සිදුවීමෙන් වළක්වාලීම සඳහා ඔහුගේ අයිතිය සුරක්ෂිත කිරීමට සියලුම ජනමාධ්‍ය ආයතන හා ජනමාධ්‍යවේදීන් වගබලා ගත යුතුය.

# <u>මාර්ගෝපදේශ සංග්‍රහය</u>

ජනමාධ්‍යවේදීන් සඳහා වූ මේ මාර්ගෝපදේශයෙන්,සදාචාර සම්පන්න ජනමාධ්‍යවේද ප්‍රමිති තවදුරටත් ශක්තිමත් කෙරෙන පොදු ප්‍රවේශයක් යෝජනා කරන අතරම, ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂාකර වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය සපයයි.

1. සෑම අවස්ථාවකදී ම සෑම ළමයකුගේම ගෞරවයට සහ අයිතීන්ට ගරු කිරීම.
2. පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය සඳහා ළමයකු සතු අයිතියට ගරු කිරීම.
3. ළමා වින්දිතයින්/ළමා සැකකරුවන්ගේ අනන්‍යතාව හෙළිදරව් වන ආකාරයෙන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ තොරතුරු හෙළිදරව් වන ආකාරයෙන් කිසිදු තොරතුරක් වාර්තාකරණය නොකිරීම. (නම,ගම,පාසල,පවුල් පසුබිම වැනි තොරතුරු)
4. ළමා වින්දිතයින්ගේ/ළමා සැකකරුවන්ගේ හා ඔවුන්ගේ සමීපතමයන්ගේඡායාරූප හෝ වීඩියෝ ප්‍රදර්ශනය නොකිරීම.
5. සිදුවීමකට අදාළ ලිංගික ක්‍රියාකාරකම් ආශ්‍රිත තොරතුරු හෙළිදරව් නොකිරීම.
6. ලිංගිකත්වයට හෝ ප්‍රචණ්ඩත්වයට අදාළ හැඟීම් දැනවීම අධෛර්ය කරවන සුළු ආකාරයෙන් අදාළ සිද්ධි වාර්තා කිරීමට වගබලා ගැනීම.
7. ළමා අපයෝජන සිදුවීම් ප්‍රබන්ධ හා ව්‍යතිරේඛ බවට පත් නොකිරීම.
8. ළමා අපයෝජනය හැඟුම්බර වන පරිදි වාර්තා කිරීම නොව,ළමයින් අපයෝජනය වීම කෙරෙහි බලපාන සමාජ සහ ආර්ථික පසුබිම කෙරෙහි අවධානය යොමු කිරීම.
9. සෑම ළමයෙකුම වඩා හොඳින් ආරක්ෂා කිරීමේ අරමුණ වෙනුවෙන්, ළමයින්ගේ ගැටලු පිළිබඳ වැඩිදුර උපදේශන සැපයීම සහ ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම ඇතුළු ඊට අදාළ වෙනත් ඕනෑම ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම.
10. අපයෝජනයට පත් කිසියම් ළමයකු / ළමා සැකකරුවකු වාර්තාකරණය මඟින් තවදුරටත් සමාජය ඉදිරියේ අපහසුතාවට පත් නොකිරීම. එහිදී වර්ගීකරණය කිරීම හෝ අමතර ශාරීරික, මානසික හානියකට ලක්වීම හෝඔවුන්ගේ ජනසමාජය විසින් වෙන්කොට සලකනු ලැබීම හෝ ප්‍රතික්ෂේප කරනු ලැබීම ද ඇතුළුව,ළමයාපීඩාවන්ට නිරාවරණය කෙරෙන ආකාරයේ තොරතුරු වාර්තාකරණය නොකිරීමට ජනමාධ්‍යවේදියා කටයුතු කළ යුතුය.
11. සිද්ධියට අදාළ නිවැරදි තොරතුරු සපයනවා හැර වැරදි තොරතුරු හෝ සිදුවීමට අදාළ අනුමාන හා කල්පිත තොරතුරු ප්‍රකාශයට පත් නොකිරීම. තොරතුරු සත්‍යවුවද එකී තොරතුරු පදනම් කරගෙන වින්දිත ළමයාගේ / ළමා සැකකරුවාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන්නේ නම් එකී තොරතුරු සැපයීමෙන් වැළකිය යුතුය.
12. වාර්තාකරණයේ දී පූර්ව විනිශ්චයන් ලබා දීමෙන් වැළකෙමින් ගවේෂණාත්මක වාර්තාකරණයක යෙදීම.
13. ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනය සහ අවිහිංසාවාදී ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම.
14. අපයෝජනයන්ගෙන් ආරක්ෂාවීමට ළමයින්ට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම.
15. ළමා අපයෝජන වළක්වා ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රජයට,සිවිල් සංවිධානවලට,ප්‍රජාවට සහ දෙමාපියන්ට ගතහැකි පියවර පිළිබඳ තොරතුරු වාර්තා කිරීම.
16. අදාළ සිද්ධිවල තොරතුරු මූලාශ්‍රයන්හි රහස්‍යභාවය සුරකීම.

17. සියදිවි නසාගැනීම, ඊට උත්සාහ දැරීම හෝ තමන්ට හානි සිදු කර ගැනීම වැනි ව්‍යසනකාරී ක්‍රියා ඇතුළුව භයානක හා අධිසංවේදී ක්‍රියා ජනමාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධියට පත් නොකළ යුතුය. එවැනි සිදුවීම් ප්‍රසිද්ධියට පත් කිරීම මඟින්ව්‍යාකූල මානසික තත්වයන්හි පසුවන ළමයින් ඒවා අනුකරණයට පෙළඹේ.

18. පීඩාවට පත් ළමයින්ට සහන සැලසීමේ දී (ස්වාභාවික ආපදාවන්වලදී පීඩාවන්ට පත්වූවන්ද ඇතුළුව) එම ළමයින්ගේ තොරතුරු හෙළිදරව් නොකිරීම හා එම ළමයින්ගේ පෞරුෂයට හානි ගෙන දෙන අයුරින් වාර්තාකරණය නොකිරීම.

19. ළමයින්ට අහිතකර බලපෑමක්ඇති කරන ආකාරයේ කිසිදු තොරතුරක් ජනමාධ්‍ය හරහා වාර්තාකරණය නොකිරීම.

20. සමස්තයක් ලෙස ළමා අපයෝජනවලින් දරුවන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය තොරතුරු හා අපයෝජන වලට එරෙහි නෛතික තත්වය සමාජගත වන අයුරින් තොරතුරු වාර්තා කිරීම.

## නියාමනය

- මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එක්ව නියාමනය කිරීම. එම නියාමනයෙන් පසු ජාතික මාර්ගෝපදේශ වලට අනුගත නොවන වාර්තාකරණයන් පිළිබඳ අදාළ ආයතන හා ජනමාධ්‍යවේදීන් සමඟ සාකච්ඡා පවත්වා නැවත එවැනි තත්වයක් ඇති නොවීම සඳහා අවශ්‍යකරන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.

## අර්ථ නිරූපණ

ළමයා යනු - වයස අවුරුදු 18 ට අඩු සෑම තැනැත්තෙකුම ළමයෙකු ලෙස සැලකේ.

ළමා අපයෝජන යනු - වැඩිහිටියන් විසින් ළමයින්ට වැරදි ක්‍රියාවන් හී යෙදවීම ළමා අපයෝජනය ලෙස අර්ථ ගැන්වේ. එය කායික අපයෝජනය, මානසික අපයෝජනය, ලිංගික අපයෝජනය හා නොසලකා හැරීම ලෙස සිව් වැදෑරුම් වේ.

වින්දිත ළමයා - යම් අපයෝජන සිදුවීමක් මත පීඩාවට පත් වන ළමයකු වේ.

සැකකරු - යම් වරදක් කර ඇති බවට අනුමාන කරන තැනැත්තකු වේ.

## සමාලෝචනය

ළමා අපයෝජන /ළමා සැකකරුවන් පිළිබඳ වාර්තාකරණයේදී ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ජනමාධ්‍යවේදීන් විසින් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ මාර්ගෝපදේශසංග්‍රහය කාලීනව විද්වත් මණ්ඩලයකගේ මාර්ගෝපදේශකත්වයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එක්ව සමාලෝචනය කළ යුත්තේය.